Living the LOTUS
Buddhism in Everyday Life
New Year's Issue 2019

年頭法話

# තමාගේ දියුණුව ක්‍රමයෙන් ඇතිකර ගනිමු

## රිෂ්ෂෝ කෝසෙයි සංවිධාන ප්‍රධානී, නිචිකෝ නිවානෝ



**‘මනුෂ්‍යයන්ව නඟා සිටුවීම’, අනාගතය දෙස ස්ථිරසාර දැක්මකින් යුතු සමාජයක් හා රටක් ගොඩනැඟීමට ඇති ඉතා වැදගත් සාධකයකි**

සුභ නව වසරක් වේවා.

ගිය වසර, අප සංවිධානය 80 වෙනි සංධිස්ථානයට පිය නැගූ වර්ෂයයි. මේ වසරේ සිට, සංවිධානයේ 100 වෙනි සැමරුම වෙනුවෙන් ඔබ සියළුදෙනා සමඟ එකම හදවතකින්, තව තවත් ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගැනීමට සිතමි.

එම අරුථින් යුතුව, මා විසින් ‘2019 වසරේ අරමුණ’ මෙලෙස එළිදැක්වූවා.

අහසත් පොළවත් යන ස්වභාව ධර්මය එක් මොහොතක් හෝ නොනැවතී, නව නිර්මාණයන් හා වෙනස්වීම් නැවත නැවත සිදු කරයි. අපිත් අහස පොළව හා සමානවම, එක තැන පල්වීමක් නොමැතිව, සෑම සියළු කටයුත්තකදීම නැවුම් හැඟීමෙන් දිනපතා නියැලීම වැදගත්ය.

මේ වසරේ අප සංවිධානයට 81 වෙනි සංවත්සරය උදාවෙයි. මේ දක්වා කාලයක් නිර්මාතෘ තුමා, සම නිර්මාතෘ තුමිය මුල් කරගෙන ජේෂ්ඨ නායක නායිකාවන් හා සාමාජික සාමාජිකාවන් තම නින්ද හා ආහාර කැපකරමින් සංවිධානය ගොඩ නැඟූහ.

ඉදිරියට උදාවන 100 වෙනි සංවත්සරය වෙත, අපි එකිනෙකා නිර්මාණාත්මකව ඉදිරියට පිය නැඟීමේ අධිෂ්ඨානයෙන්, කළගුණ දැක්විය යුතු යැයි සිතමි.

මෙම අරමුණ ගිය වසරේ අරමුණ සමඟ එක හා සමාන

# New Year's Message 2019

වුවත්, මෙම කරුණ සාමාජිකයන් වන අප ඉතාම වැදගත් කොට සැලකිය යුත්තකි.

අරමුණ තුල 'නිර්මාණාත්මකව ඉදිරියට පිය නැඟීම' යනුවෙන් වදනක් ඇත. නමුත් එහි අරුත හුදු 'අළුත් දෙයක් නිර්මාණය කිරීම' පමණක් නොවේ.

බුදු දහමේ ජය හෝ පරාජය, දියුණුව හෝ කඩා වැටීම, අළුත් හෝ පරණ යන සාධකයන්ට එහාගිය විශ්වීය වටිනාකම වැදගත්ව සලකයි. එනම්, මනුෂ්‍යයන්ගේ ක්‍රියාකාරීත්වය සෑම කල්හිම නියත වු ශක්තිය ලබාදෙන්නේ, දීප්තිමත් හදවත, කාරුණික හදවත හා උණුසුම් හදවතයි. එම හැඟීම අපි එකිනෙකා පවුල, පාසල, කාර්යාලය, ජීවත්වන්නාවු ප්‍රදේශයේ වාගේම ලෝකයටම නොබිදෙන සැබැඳියාවෙන් ලබාදීමට තමා විසින් පියවරක් ඉදිරියට තබා කටයුතු කිරීම සැබෑව වු, 'නිර්මාණාත්මකව ඉදිරියට පිය නැඟීම' වේ.


එම කරුණ අමතක නොකර, තම තමන්ට හැකි අයුරින්, එදිනෙද කරන කටයුතු වලට ප්‍රායෝගිකව බද්ධ කර ගනිමු.

මම, අප සංවිධානයේ 80 වෙනි සංවත්සර පාදක කරගෙන, උදවන 100 වන සංවත්සරය වෙනුවෙන් 'මානව සම්පත් සංවර්ධනය - මිනිසුන්ව නගා සිටුවීම -මුලික කරගෙන උපරිම ශක්තියෙන් කැපවී කටයුතු කිරීම අපගේ වැදගත්ම රාජකාරිය වේ' ලෙස ප්‍රකාශ කලා.

'මිනිසුන්ව නගා සිටුවීම' ගැන වදන චීනයේ ඉපැරණි පොතක සඳහන් වේ.

ගිය වසරේදී අරමුණ පැහැදිලි කල අතිරේක ලේඛනයේ 'වසරක සැලසුමක් නම්, ධාන්‍ය වගා කිරීම හොඳය. වසර 10 ක සැලසුමක් නම්, ශාක වගා කිරීම හොඳය. ජීවිත කාලයට තිබෙන සැලසුමක් නම්, මානව සම්පත් සංවර්ධනය හැර වෙන කිසිවක් නොමැත' ලෙස පද්‍යයක් සඳහන් කලහ.

මනුෂ්‍යයන්ව නගා සිටුවීම යන තේමාව, 'ජීවිත කාලයටම තිබෙන සැලැසුම' ක් බැවින් -මනුෂ්‍යයන් විසින් තම ජීවිත කාලයම ඒ වෙනුවෙන් කැප කළ යුතුය. එබැවින් අනාගතය දෙස ස්ථිරසාර දැක්මකින් යුතු සමාජයක් හා රටක් ගොඩනැඟීම ඉතා වැදගත් සාධකයකි.



එසේම මනුෂ්‍යයන්ව නගා සිටුවීම, මහා පොළොවේ ශාකයන් සිටුවීමට සසඳ බලනවා නම්, ශාක මුලය පොළොවට බද්ධ වු පසු, එම ශාකය සිටවු තැනැත්තා නොසිටියත්, ශාකයේ වැඩීම නැවැත්විය නොහැකිය. ඒ ආකාරයට ස්වාධීනත්වයෙන් යුතු, උද්යෝගිමත්ව ජීවත්වන ආකාරයට මනුෂ්‍යයන්ව පුහුණු කිරීමේ වගකීම, 'මනුෂ්‍යයන්ව නගා සිටුවීම' යන වදනෙන් නිරූපණය වේ.

## ආධ්‍යාත්මික පරිපූර්ණත්වය ඇතිකර ගැනීමේ ප්‍රධාන ස්ථානය පවුලයි. දෙමාපියන්ගේ ස්වරූපය දරුවන්ට නිසැකවම බලපෑම් ඇති කරයි

නියමාකාරයෙන් මනුෂ්‍යයන්ව පුහුණු කිරීමේදී, විශේෂයෙන් වැදගත්කොට සැලකිය යුතු වන්නේ මුල් ළමා අවධියයි, එනම් පවුල තුල ලබාදෙන පුහුණුවයි.

අවුරුදු 3 දක්වා මනුෂ්‍යයෙකු ලෙස මොළයෙහි 80% ක ප්‍රමාණයක් වර්ධනය වී, අවුරුදු 5, 6 වන විට ගතිගුණ වල හැඩය තීරණය වේ. මතක ශක්තිය හා අවධාරණය කිරීමේ ශක්තිය අවුරුදු 12, 13 වයසේදී හොඳින්ම ශක්තිමත් වී, අවුරුදු 16, 17 වයසේදී සාමාන්‍ය මනුෂ්‍යයෙකු ලෙස අංග සම්පූර්ණ තත්වයට පත්වේ.

පවුල යනු අධ්‍යාත්මික පරිපූර්ණත්වය ඇති කර ගැනීමේ පදනම වේ. අපි දිනපතා උදේ හා සවස බුදුන් වැඳ සූත්‍ර සජ්ඣායනා කර බුදුන් වහන්සේට කෘතවේදීත්වය පුද කරන ස්වරූපය, දරුවන්ට නිසැකවම බලපෑමක් ඇති කරයි. එසේම දරුවන්, දෙමාපියන්ගේ ආලෝකමත් බවට, කාරුණිකත්වයට හා උණුසුම් හදවතට වෙළී සිටින්නේ නම් ස්වභාවයෙන්ම සාරධර්ම වලින් සපිරි මානුෂික ගතිගුණ ගොඩනැගෙන්නේය.

නමුදු, එදිනෙද කටයුතු ඊට හාත්පසින්ම වෙනස් ආකාරයෙන් සිදුකරන්නාවු දෙමාපියන් දෙස බලා සිටින දරුවන්, ස්වභාවයෙන්ම ඊට සමාන ආකාරයට කටයුතු කරයි. එසේම තමාට අවශ්‍ය පරිදිම දරුවන්ව මෙහෙයවීමට කටයුතු කළ විට, ඒ වෙලාවට පමණක් දරුවන් අවනත වූවාසේ පෙනුනද, දඩබ්බර ගති ඇතිවී ටිකෙන් ටික දෙමාපියන්ගෙන් ඈත් වේ.

පොල්ලක් ඇදයට සිටුවා, එහි සෙවණැල්ල කෙළින් කිරීමට උත්සහ කලත්, සෙවණැල්ල කෙළින් නොවේ. පොල්ල කෙළින් සිටුවන්නේ නම්, ස්වභාවයෙන්ම එහි සෙවණැල්ලද කෙළින් තිබීම න්‍යාය වේ.

දරුවන් ක්‍රියාකරන ආකාරය සාමාන්‍ය ජීවිතයේ දෙමාපියන්ගේ ස්වරූපය පෙන්වන කණ්නාඩිය වේ. සමාජය තුල පවතින දරුවන්ගේ ප්‍රශ්න ගැටළු තුලින් පෙන්වන්නේද, වැඩිහිටි ලෝකයේ තිබෙන නොගැලපෙන විසංවාදී සිදුවීම්ය.

එබැවින් දරුවන්ගෙන් අපේක්ෂා කරන්නාවූ දේවල් ප්‍රථමයෙන් දෙමාපියන්, නැතිනම් වැඩිහිටියන් ක්‍රියාවට නැංවීම වැදගත් වන්නේය.

පෙරදිග දර්ශනවාදය පිළිබඳ කීර්තිමත් ගත්කතුවරයෙකු වන මසහිරෝ සයුඔකා මහතාගේ පොතක මේ ආකාරයේ වැකියක් සඳහන් විය.

'දරුවන්ගේ ගෞරවණීය බවේ සංකේතය තාත්තා විය යුතුය. දරුවන්ගේ ආදර මෛත්‍රියේ පුදසුන අම්මා විය යුතුය. ඒ මන්දයත්, දරුවන්ගේ වැඩීමට අත්‍යාවශ්‍යය තෝතැන්න පවුල වන නිසාය.'

ගොයම් පැළ සිටුවීමේදී, නියමාකාරයෙන් පිදීමට හැකි තෝතැන්නක් ලෙස කුඹුර සකස් වී නොතිබෙන්නේ නම්, හොඳ ඵලදාවක් අපේක්ෂා කිරීමටද නොහැකිය.

## බුදුන් වහන්සේ ප්‍රාර්ථනා කරන්නාවූ මනුෂ්‍යයන්ගේ නියම ජීවන ශෛලිය, බෝධිසත්ව චර්යයාවේ යෙදීමයි.

අදල කරුණු අනුව, මේ දක්වා 'බුදුන් වහන්සේ වාගේම, නිර්මාත්‍ය තුමා, සම නිර්මාත්‍ය තුමිය විසින් මිනිසුන්ට දැක්වූ දයාවේ හැඟීම වාගේම, සෑම මනුෂ්‍යයෙකු තුල තිබෙන 'දීප්තිමත්, කාරුණික, උණුසුම්' හැඟීම පෙරදැරි කරගෙන බෝධිසත්ව චර්යයාවේ යෙදෙමු'' ලෙස මම නිතරම පැවසූහ.

ඒ ආකාරයට බෝධිසත්ව චර්යයාවේ යෙදීම, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කරමින් බුදුන් වහන්සේ ප්‍රාර්ථනා කලාවූ මනුෂ්‍යයන්ගේ නියම ජීවන ශෛලියයි.

බෝධිසත්වයන් යනු, ධර්මය හොඳින්ම විශ්වාස කර, අවබෝධ කරගෙන, සත්‍යාවබෝධය ලබා ගැනීම සඳහා අධ්‍යාත්මික දියුණුව ඇතිකර ගැනීමට අධිෂ්ඨාන කරගත් පිරිසයි. තවත් ආකාරයකට පවසනවා නම්, තම හදවත බුදුන් හා සමාන හදවතකට පත්කර ගැනීමට උත්සහ කරන පිරිසයි. එසේම බෝධිසත්ව ජීවන ශෛලියක ප්‍රභවය වන්නේ මෛත්‍රිය හා කරුණාවයි.

අපි එකිනෙකා බෝධිසත්වයන් බවට පත්වීමට අරමුණු කරන්නේ නම්, හැමදෙයටම වඩා වැදගත් වන්නේ තම ස්වයං ශෛලියට නොව, බුදුන් වහන්සේගේ ශෛලියට 'ධර්මය ඉගෙන ගෙන අධ්‍යයන කටයුතු කිරීම' ය.

ඉගෙන ගෙන අධ්‍යයන කටයුතු කිරීම ජපන් භාෂාවෙන් 'ෂුගකු' (習学/shugaku) නම් වේ. 'ෂු' යන කන්ජි අකුර ලිවීමේදී භාවිතා කරන්නේ 'කුරුල්ලන්ගේ පිහාටු යන (羽) අකුර හා සුදු පාට (白) යන අකුරුයි. කුරුළු පැටවෙකු වර්ධනය වී, දෙමාපියන්ගේ ආහාෂය ලබා අත්තටු ගසමින් ඉගිලී යාමට උත්සහ කරන ස්වරූපය එයින් පෙන්වයි.


අපිද, කූඩුවෙන් ඉගිලී යාමට අරමුණු කරගෙන කටයුතු කරන කුරුළු පැටවුන් වාගේ, දිනපතා බුදු දහම නිවැරදිව අවබෝධ කරගෙන, එම කරුණු නියමාකාරයෙන් තම ජීවිතයට බද්ධ කරගෙන, නැවත නැවත ඒ අනුව ප්‍රායෝගිකව කටයුතු කලවිට, බුදුන්ගේ හදවතට ළඟා වීමට හැකිවේ.

ඒ ආකාරයට දිනපතා අප කටයුතු කරන ආකාරය කුරුළු දෙමාපියන් සේ අප දෙස බලා සිටිමින්, අපට උදව් උපකාර කරනුයේ සාමාජික පිරිසයි. සාමාජිකයන්ගේ ප්‍රශංසාත්මක බව හා ධර්ම කරුණු කියාදීම නිසා සැහැල්ලුවෙන් ශක්තිමත් හදවතකින් ධර්මය ප්‍රායෝගික පුහුණුවේ යෙදීමට හැකිවීම විශිෂ්ට දෙයකි.

නමුත්, නවක සාමාජිකයන් 'මම නම් විශිෂ්ඨ කෙනෙක් නොවන නිසා, බෝධිසත්වයන් කෙනෙකු බවට පත්වීමට නොහැකියි' ලෙස පසු බසිනා අයද සිටීමට පුළුවන.

අනිවාර්යයෙන්ම සෑම මනුෂ්‍යයකුම ආශාවන්, තරහව, අමනෝඥකම ආදී තෘෂ්ණාවෙන් යුතුය. සාමාන්‍යයෙන් තෘෂ්ණාව හොඳ නැහැ ලෙස අපි සිතයි. තෘෂ්ණාව නිසා දුක කණගාටුව සත්‍යය ලෙසම ඇති වන බැවින්, එය විසඳ ගැනීමට සත්‍යය අවබෝධ කර ගැනීමේ හදවතට පත්වීමට සිතයි.

එනම් දුක කණගාටුව හා සත්‍යාවබෝධය එකට බැදී තිබෙන බව අවබෝධ කර ගැනීම හා අවබෝධ කර දීම, ඉතාමත් වැදගත් කරුණකි.



# New Year's Message 2019

ඒවාගේම සෑම මනුෂ්‍යයයෙකුම බුදුන් වහන්සේ හා සමාන මෛත්‍රිය හා කරුණාවෙන් යුතු බව කියාදී ඇත.

දුකට පීඩාවට පත් වී සිටින අයගේ දුකට ඇහුම්කන් දී, ඔවුන්ව දුකින් මුදවා ගැනීම තුලින් ඉතා විශාල සතුටක් තමාට අත්විඳීමට හැකිවේ. පාරේ වැටී තිබෙන කුණු ඇහිඳීම, නොයෙකුත් පරිත්‍යාගයන් කිරීම, අසුන අන් අයට පිළිගැන්වීම ආදිය කරන විට වචන වලට පෙරලිය නොහැකි ප්‍රබෝධයක් දැනෙයි. එය බුදුන් හා සමාන මෛත්‍රිය කරුණාව තිබෙන බවට සාධකයයි.

අපි එකිනෙකා තුල තිබෙන හැකියාව විශ්වාස කර, තමා විසින්ම, බෝධිසත්වයන් කෙනෙකු ලෙස ජීවත් වෙමුයි අධිෂ්ඨානයෙන් යුතුව පියවර තබමින්, එක් පුද්ගලයෙකු හෝ වැඩි දෙනකු බෝධිසත්වයන් ලෙසට නිර්මාණය කරමින් කලබල නොවෙමින් සීරුවෙන් ඉදිරියට ගමන් කරමු.

එසේම මෙම වසරේ මැයි මාසයෙන් ජපානයේ අධිරාජ්‍යායගේ විශ්‍රාම ගැනීමත් සමඟම 'හෙයිසෙයි යුගය' අවසන් වේ. වත්මන් අධිරාජ්‍යයාගේ යුගය හෙයිසෙයි ලෙස නම් කලේ, 'අභ්‍යන්තර සාමකාමීත්වයෙන්, බාහිර ගොඩනගමු' යන අරුතෙනි. රටද මනුෂ්‍යයන්ද, එහි ඇතුලත හා පිටතද සාමකාමි හා සංසුන්බවින් තිබේ නම්, පිටත ලෝකයටද එය ආදර්ශයක් වන බව අදහස් වේ.

'හෙයිසෙයි' යුගයේ කටයුතු කරමින් පැමිණි අපි, එහි අරුථ නියමාකාරයෙන් ධාරණය කරගෙන, එදිනෙද ජිවිතය ගත කිරීම අත්‍යාවශය.

වර්තමානයේ මනුෂ්‍යයන්ගේ තිබෙන ගැටළුවක් නම්, අපව කවුරුන් හෝ දුකින් මුදවා ගනීවි යැයි සිතමින් බලාසිටියි, නමුත් එයින් ප්‍රතිපලයක් ලැබෙන්නේ නැත. බුදුන් වහන්සේ විසින් පොලෝ ගර්භයෙන් පැමිණි බෝධිසත්වයන්ට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ප්‍රචලිත කිරීම භාර කලා සේ, වත්මන් ලෝකයේ දුකින් පීඩාවට පත්වූ පුද්ගලයන්ද ඉතා කැපවීමෙන් ධර්ම ව්‍යාප්ත කටයුතු කරන්නේද ඒ තුලින් දුකින් මිදීමට හැකිවන්නේය.

එබැවින්, තමාව පහත්කොට නොසලකා, ධර්මය විශ්වාස කර, අවබෝධ කරගෙන, මෛත්‍රිය හා කරුණාවේ හදවතින් බෝධිසත්ව චර්යයාවේ යෙදෙමු. එය අපගේ ආධ්‍යාත්මික අරමුණ වනවාසේම, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ තේමාවද වන්නේය.

එම කරුණ හදවතට බද්ධ කරගෙන, මේ වසරේදීත් සියළුදෙනා සමඟ අත්වැල් බැදගෙන ඉදිරියට යාමට අපේක්ෂා කරමු.

('කෝසෙයි පුවත්පත' 2019 ජනවාරි මස 6 වන දින)

